පඩිපාලක සභාව මගින් ආවරණය වන සංවිධානය වූ පෞද්ගලික අංශයේ 1982 වර්ෂයේදී සියයට 16 ක් වූ සාමාන්‍ය මූල්‍ය වැටුප් වර්ධනය හා සසඳන කල, 1983 දී එය සියයට 7 කින් වර්ධනය විය. 1982 වර්ෂයේ දී සියයට 4 ක් වූ වර්ධනයට ප්‍රතිවිරුද්ධ ලෙස 1983 දී මූර්ත වැටුප් සියයට 6 කින් පහත වැටුණි.

සංවිධානය වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත හා වෙළෙඳ, කෘෂිකර්මය හා සේවාවන්වල නියුතුව සිටින සේවකයන්ගේ නාමික වැටුප් පිළිවෙලින් සියයට 1.3, 10 හා 5 වශයෙන් වැඩිවිය. මෙම වර්ධනයන් 1982 දී වූ වර්ධනයන්ට වඩා අඩුවිය. 1983 වර්ෂයේදී කර්මාන්ත හා වෙළඳ අංශයේ, මූර්ත වැටුප් සියයට 11 කින් පහත වැටුණු අතර, කෘෂිකර්ම අංශයේ හා සේවා අංශයන්හි මූර්ත වැටුප් පිළිවෙලින් සියයට 8 කින් හා 4 කින් පහත වැටුණි. මෙය 1982 වූ මූර්ත වැටුප් වර්ධනයට ප්‍රතිවිරුද්ධ වූවකි.

සංවිධානය නොවූ අංශයේ වැටුප් සංචලනය තීරණය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල යටතේ ලබා ගන්නා තොරතුරු මතය. මෙම වැඩපිළිවෙල යටතේ විධිමත් පදනමක් මත, වී, පොල්, රබර් සහ තේ වගාවන්හි කුඩා වතු අංශයේ සහ ඉදිකිරීම් අංශයේ නියුතු සේවකයන්ගේ දෛනික වැටුප් තොරතුරු එක්රැස් කරනු ලැබේ.

**1 . 34 සංඛ්‍යා සටහන**

**සංවිධානය නොවූ අංශයෙහි දෛනික වැටුප් සාමාන්‍යයන්**

| සංවිධානය නොවූ අංශය | ශ්‍රමිකයා | දෛනික වැටුප් ප්‍රමාණයන් 1982 | දෛනික වැටුප් ප්‍රමාණයන් 1983 | වෙනස රුපියල්වලින් | වෙනස ප්‍රතිශතයකින් |
|---|---|---|---|---|---|
| වී | පිරිමි .. | 30·66 | 36·61 | 5·95 | 19 |
| | ගැහැණු .. | 22·26 | 26·94 | 8·42 | 21 |
| පොල් | පිරිමි .. | 32·39 | 37·78 | 2·26 | 17 |
| | ගැහැණු .. | 18·26 | 21·52 | 3·26 | 18 |
| රබර් | පිරිමි .. | 26·22 | 31·08 | 6·63 | 18 |
| | ගැහැණු .. | 18·88 | 22·30 | 3·42 | 18 |
| තේ | පිරිමි .. | 22·17 | 23·81 | 1·64 | 7 |
| | ගැහැණු .. | 15·86 | 16·78 | 0·92 | 6 |
| වඩු කර්මාන්තය | පිරිමි .. | 53·86 | 59·94 | 6·08 | 11 |
| පෙදරේරු කර්මාන්තය | පිරිමි .. | 52·44 | 58·31 | 5·66 | 11 |

මූලය : දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල; ශ්‍රී ලංකා මහ බැංකුව.

1983 වර්ෂයේදී සියළුම අනුඅංශයන්හි, මූල්‍ය වැටුප් වැඩිවූ අතර, තියුණුම වර්ධනයක් වූයේ වී හා රබර් අනුඅංශයන්හිය. වී වගාවේ නියුතු ගැහැණු ශ්‍රමිකයන්ගේ දෛනික වැටුප සියයට 21 කින් වැඩි වූ අතර, පිරිමි ශ්‍රමික වැටුප සියයට 19 කින් වැඩිවිය. රබර් වගාවන්හි නියුතු පිරිමි සහ ගැහැණු ශ්‍රමිකයන්ගේ වැටුප සියයට 18 කින් වැඩිවිය. පොල් සහ තේ වගා අංශයන්හි ගැහැණු ශ්‍රමික වැටුප් ප්‍රමාණයන් පිරිමි ශ්‍රමික වැටුප් මෙන් නොව, 1982 වර්ෂයට වඩා ඉහළ අනුපාතයකින් වැඩි විය. ඉදිකිරීම් අංශයේ නියුතු වඩු කාර්මික හා පෙදරේරු වැටුප් 1982 වර්ෂයට වඩා අඩු ප්‍රමාණයකින් වර්ධනය විය. 1982 හා 1983 වර්ෂ තුළදී සිදුවූ වෙනස්වීම් හා සාමාන්‍ය දෛනික වැටුප් ප්‍රමාණයන් 1.34 වැනි සංඛ්‍යා සටහනින් දක්වයි.

## වෙළෙඳාම

ගත වූ වසර කීපය තුළ දියුණු වූ රටවල පැවති ආර්ථික පසුබෑම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ තේ හා රබර් සඳහා පෙර නොවූ විරූ ලෙස මිළ ගණන් වැඩිවීම හේතුකොටගෙන 1983 වසරේ ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳාමෙහි සැළකිය යුතු වර්ධනයක් ඇති විය.

1983 වසරේදී අපනයන ඉපැයීම් විගැහි වටිනාකම් අනුව සියයට 7 කින් වර්ධනය වූ අතර 1977 න් පසු ප්‍රථම වරට ආනයනයන්හි අඩුවීමක් වාර්තා කළේය. මේ මගින් කෙසේ වෙතත්, අසතුටුදායක වූ සමහර උපනතීන් පෙන්නුම් නොකරයි. තේ සහ රබර් මිළෙහි වැඩි වීම නිසා වැවිලි භෝග අංශයෙන් ලත් අපනයන වටිනාකම පසුගිය වර්ෂයට වඩා විශාල වැඩිවීමක්

දක්වූ නමුදු, මෙවායේ අපනයන පරිමාව තවදුරටත් පහත වැටුණි. ආනයන වටිනාකම් පහත වැටීමට විශාල වශයෙන්ම ඛනිජ තෙල් සහ ආයෝජන භාණ්ඩ, විශේෂයෙන් ම නැව් හා ගුවන් යානා ආනයන අඩුවීම හේතු විය. 1982 වසර හා සසඳන විට 1983 වසරේදී මුළු ආනයනයන්ගෙන් පාරිභෝගික භාණ්ඩවල පංගුව වැඩි වූ අතර ආයෝජන හා අන්තර් භාණ්ඩවල පංගුව පහත වැටුණි.

### 1 . 35 සංඛ්‍යා සටහන
### වෙළෙඳ තුලනය 1981—1983

වටිනාකම රුපියල් දශ ලක්ෂ
(වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන (අ) | | අපනයන (ඈ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද(ඇ) | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1981 | 35,530<br>(1,567) | 36,582<br>(1,614) | 20,199<br>(891) | 21,043<br>(928) | – 15,331<br>(– 676) | – 15,539<br>(– 686) |
| 1982 | 36,876<br>(1,605) | 41,946<br>(1,826) | 21,124<br>(919) | 21,454<br>(934) | – 15,751<br>(– 686) | – 20,492<br>(– 892) |
| 1983 (ආ) | 42,021<br>(1,671) | 45,553<br>(1,811) | 25,183<br>(1,001) | 25,096<br>(998) | – 16,838<br>(– 669) | – 20,457<br>(– 813) |

(අ) සණ රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) රේගු වාර්තාවේ සඳහන් නොවූ නැව් සහ ගුවන් යානා වටිනාකම් ඇතුළත්ය.
(ඈ) ප්‍රති-අපනයන ඇතුළත්වේ.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන ආනයන කරුවෝ,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
රාජ්‍ය මැණික් සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

1983 වසරේදී ද, වෙළෙඳ තුලනයේ හිඟයක් වාර්තා විය. රේගු සංඛ්‍යා අනුව, 1983 වසරේ මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 42,021 (විගැහි දශ ලක්ෂ 1,671) ක් සහ අපනයනයන්ගෙන් ලත් මුළු ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 25,183 (විගැහි දශ ලක්ෂ 1,001) වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 16,838 (විගැහි දශ ලක්ෂ 669) ක් විය. මෙය ඉකුත් වසරේ රුපියල් දශ ලක්ෂ 15,751 (විගැහි දශ ලක්ෂ 686) ක හිඟයට වඩා විගැහි වටිනාකම් අනුව සියයට 2 කින් අඩුවීමකි. වඩා යථාරූපී චිත්‍ර පිණිස රේගු සංඛ්‍යා ගැලපූ විට, මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 45,553 (විගැහි දශ ලක්ෂ 1,811) ක් වූ අතර, අපනයන වලින් ලත් මුළු ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 25,096 (විගැහි දශ ලක්ෂ 998) ක් විය. මෙසේ ගලපන ලද සංඛ්‍යාවලට අනුව රුපියල් දශ ලක්ෂ 20,457 (විගැහි දශ ලක්ෂ 813) ක් දක්වා වූ ඉහළ ගිය වෙළෙඳ තුලනයක් පෙන්නුම් කෙරේ. මේ අනුව ඉකුත් වසරේ රුපියල් දශ ලක්ෂ 20,492 (විගැහි දශ ලක්ෂ 892) ක ගලපන ලද වෙළෙඳ හිඟය සමග සසඳන විට 1983 වසරේ හිඟය, සියයට 9 කින් අඩුවී ඇත.

අපනයන මිළ දර්ශකය අනුව ගණනය කරන ලද අපනයන මිළ, 1982 වසරේ සියයට 8 ක පහත වැටීම හා සසඳන විට 1983 වසරේ සියයට 39 කින් වැඩි විය. මේ අතර, අපනයන පරිමා දර්ශකය මගින් ගණනය කරන ලද අපනයන පරිමාව 1982 වසරේ සියයට 10 ක වැඩිවීම හා සසඳන විට සියයට 3 කින් පහත වැටුණි. ආනයන මිළ දර්ශකය අනුව 1982 වසරේ සියයට 10 කින් වැඩි වූ ආනයන මිළ 1983 වසරේදී සියයට 21 න් වැඩි විය.

1983 වසරේදී අපනයන හා ආනයනයන්හි සාපේක්ෂ මිළ හැසිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් රටේ වෙළෙඳ අනුපාතය සියයට 16 න් දියුණු විය. 1977 සිටම අඛණ්ඩව පිරිහෙමින් පැවති වෙළෙඳ අනුපාතයේ මෙම දියුණුව වැදගත් සංවර්ධනයකි.

## 1·36 සංඛ්‍යා සටහන
## විදේශීය වෙළෙඳාම 1974—1983

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක 1978=100 | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිළ | | වෙළෙඳ අනුපාතය |
| | අපනයන (නැ.වි.ස.) | ආනයන (මි.ර.ගැ.) | වෙළෙඳ තුලනය | සියළුම අපනයන | සියළුම ආනයන | සියළුම අපනයන | සියළුම ආනයන | |
| 1974 | 3,471 | 4,554 | – 1,083 | 89 | 42 | 31 | 42 | 72 |
| 1975 | 3,933 | 5,251 | – 1,318 | 107 | 52 | 29 | 49 | 58 |
| 1976 | 4,815 | 4,645 | + 170 | 102 | 57 | 34 | 44 | 78 |
| 1977 | 6,638 | 6,007 | + 631 | 94 | 73 | 55 | 54 | 102 |
| 1978 | 13,206 | 14,687 | – 1,481 | 100 | 100 | 100 | 100 | 100 |
| 1979 | 15,273 | 22,560 | – 7,287 | 101 | 123 | 109 | 152 | 72 |
| 1980 | 17,595 | 33,942 | – 16,347 | 99 | 140 | 126 | 217 | 58 |
| 1981 | 21,043 | 36,582 | – 15,539 | 102 | 145 | 129 | 282 | 46 |
| 1982 | 21,454 | 41,946 | – 20,492 | 112 | 150 | 119 | 309 | 38 |
| 1983(අ) | 25,096 | 45,553 | – 20,457 | 109 | 180 | 165 | 375 | 44 |

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික
1980 සිට ඉදිරියට ගලපන ලදී.

**අපනයන**

1983 වසරේදී අපනයන (ගලපන ලද දත්ත) ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 25,096 (විගැහි දශ ලක්ෂ 998) ක් වූ අතර එය 1982 වසරට වඩා රුපියල් දශ ලක්ෂ 3,642 (විගැහි දශ ලක්ෂ 64) ක වැඩිවීමක් පෙන්විය. මේ අනුව අපනයන වර්ධන අනුපාතිකය රුපියල් වටිනාකම අනුව සියයට 17 ක් හෝ විගැහි වටිනාකම අනුව සියයට 7 ක් විය. එය ගත වූ වසරේ පිළිවෙලින් පැවති සියයට 2 සහ 0.6 වර්ධනයන් සමග සැසඳිය හැකිය. මෙම ඉහළ අපනයන වර්ධන අනුපාතයට මුළුමනින්ම හේතු වූයේ පිළිවෙලින් සියයට 29 (විගැහි අනුව සියයට 18), සියයට 32 (විගැහි අනුව සියයට 22) සහ සියයට 35 (විගැහි අනුව සියයට 24) බැගින් වැවිලි භෝග අපනයන, ඛනිජමය අපනයන සහ ඇඟළුම් අපනයනවල ඉපැයීම් ඉහළ යාමයි. කෙසේ වෙතත් රෙදිපිළි අපනයනයන්හි විශාල වර්ධනයට ප්‍රතිවිරුද්ධව, කාර්මික අපනයනවල ඉපැයීම් සමස්ථයක් වශයෙන් ගත් කළ විගැහි වටිනාකම් අනුව සියයට 3 කින් පහත වැටුණි. මෙය සම්පූර්ණයෙන්ම ඛනිජ තෙල් නිෂ්පාදිත සහ අනෙකුත් කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලත් ඉපැයීම් පහත වැටීම නිසා සිදුවූවකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු අපනයන වලින් කාර්මික අපනයනවල පංගුව 1982 සියයට 39 සිට 1983 සියයට 35 දක්වා පහත වැටුණි. මුළු අපනයන වලින් කෘෂිකාර්මික අපනයනවල පංගුව සියයට 54 සිට සියයට 58 දක්වාද, ඛනිජමය අපනයන පංගුව සියයට 4 සිට 5 දක්වාද ඉහළ ගියේය.

කෘෂිකාර්මික අපනයන කාණ්ඩය තුළ තේ, රබර් සහ පොල් නිෂ්පාදිත වලින් ලද ඉපැයීම් පිළිවෙලින් සියයට 31 (විගැහි සියයට 20), සියයට 23 (විගැහි සියයට 12) සහ සියයට 28 (විගැහි සියයට 17) බැගින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු අපනයන ඉපැයීම් වලින් පාරම්පරික වැවිලි භෝග අංශයෙහි කොටස 1982 දී සියයට 47 සිට 1983 දී සියයට 52 දක්වා වැඩි විය. කෙසේ වෙතත්, කෘෂිකාර්මික අපනයන අංශයෙහි වූ බලාපොරොත්තු කඩ කරවන ලක්ෂණය නම්, මීට පෙර දෙ වසරෙහිම සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළ සුළු කෘෂිකාර්මික අපනයනවල ඉපැයීම් (රුපියල් සහ විගැහි යන දෙ අංශයෙන්ම) පහත වැටීමයි. මේ අනුව කෘෂිකාර්මික අපනයන වලින් ලත් ඉපැයීම් වල ඉහළ යාම ප්‍රධාන වශයෙන් ම වැවිලි භෝග අංශයෙන් ලත් අධික ඉපැයීම් නිසා සිදුවිය. සැබවින්ම, මුළු අපනයන ආදායමට තේ වලින්

පමණක් ලද දායකත්වය 1982 දී සියයට 30 සිට 1983 දී සියයට 33 දක්වා වැඩිවිය. මේ අතර රබර් අපනයන වටිනාකම ඛනිජ තෙල්වලට වඩා ඉහළ ගිය අතර, 1983 වසරේ වෙළෙඳ ගිණුමේ තෙවන විශාලතම විදේශීය විනිමය ඉපයුම්කරුවා බවට පත් විය.

කාර්මික භාණ්ඩ අංශයෙහි ඛනිජ තෙල් නිෂ්පාදිත සහ අනෙකුත් කාර්මික අපනයන වලින් ලත් ඉපැයීම් රුපියල් වටිනාකම අනුව මෙන්ම විගැහි වටිනාකම අනුවද සැළකිය යුතු ලෙස පහත වැටිණි. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන රුපියල් අනුව සියයට 18 කින් සහ විගැහි වටිනාකම් අනුව සියයට 25 කින් පහත වැටුණු අතර, අනෙකුත් කාර්මික අපනයන රුපියල් අනුව සියයට 6 කින් සහ විගැහි වටිනාකම් අනුව සියයට 14 කින් අඩු විය. කෙසේ වෙතත්, මෙම අඩුවීම්, රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්හි වූ රුපියල් දශ ලක්ෂ 1,236 (විගැහි දශ ලක්ෂ 36) ක තියුණු වර්ධනය මගින් සමහන් කළ අතර, මුළු කාර්මික අපනයන ඉපැයීම්වල සියයට 7 ක වර්ධනයක්ද ඇති කරන ලදී. එසේ වුවත් සම්පූර්ණයෙන්ම පාරම්පරික නොවන නිෂ්පාදන වන අනෙකුත් කාර්මික අපනයනයන්ගේ ඉපැයීම් පහත වැටීම, අපනයන විවිධාංගීකරණය සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ගැන සළකා බලන විට විශේෂ අවධානයට යොමු විය යුතු කරුණකි. කාර්මික අපනයනවල පංගුව අඩුවීම මගින්ද මෑත අවුරුදුවල දක්නට ලැබුණු වඩාත් විවිධාංගී අපනයන ව්‍යුහයක් දෙසට නැඹුරුවීමේ උපනතියෙහි ආපසු හැරීමක් පෙන්නුම් කරන ලදී.

1983 තේ අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,953 (විගැහි දශ ලක්ෂ 54) ක වර්ධනයක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 8,295 (විගැහි දශ ලක්ෂ 330) ක් විය. මෙය ළඟා කර ගන්නා ලද්දේ නිෂ්පාදනය හා අපනයන පරිමාව තියුණු ලෙස පහත වැටීමට ප්‍රතිවිරුද්ධවය. මුළු නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 179 දක්වා සියයට 4 න් පහත වැටුණු අතර, අපනයන පරිමාව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 158 දක්වා සියයට 13 න් අඩු විය. නිෂ්පාදනයේ මෙම අඩුවීම පිළිබිඹු කරමින්, කොළඹ වෙන්දේසිවලදී අලෙවි කරනු ලැබූ තේ ප්‍රමාණය 1982 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 181 සිට 1983 කිලෝග්‍රෑම් දශ ලක්ෂ 167 දක්වා සියයට 8 න් පහත වැටුණි. එසේම, ලන්ඩන් වෙන්දේසිවලට ඉදිරිපත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ තේ ප්‍රමාණයද, 1982 කිලෝග්‍රෑම් දශ ලක්ෂ 3.8 සිට 1983 කිලෝග්‍රෑම් දශ ලක්ෂ 1.6 දක්වා සියයට 58 න් පහත වැටිණි. තේ අපනයන පරිමාව මෑත වසරවලදී අඩු වෙමින් පැවති අතර, මේ වසරේ අපනයනය කරන ලද පරිමාව 1956 න් පසු වාර්තාගත අවම ප්‍රමාණය විය. 1983 දී තේ අපනයන පරිමාව, 1975 අපනයනික තේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 213 ක උපරිමය සමග සසඳන විට කිලෝග්‍රෑම් දශ ලක්ෂ 55 ක පහත වැටීමක් පෙන්වීය.

මෙතෙක් නොවූ විරූ ලෙස තේ මිළ ගණන් සියයට 50 (විගැහි අනුව සියයට 38) කින් ඉහළ යාම මගින් අපනයනික තේ ප්‍රමාණයෙහි වූ පහත වැටීම සමහන් කරනු ලැබීය. තේ මිළ 1982 දී කිලෝග්‍රෑමයක් රුපියල් 35.03 (විගැහි 1.52) සිට 1983 දී කිලෝග්‍රෑමයක් රුපියල් 52.52 (විගැහි 2.09) දක්වා වැඩි විය. (කොළඹ වෙන්දේසියේදී සියළුම තේ සඳහා ලැබුණු සාමාන්‍ය දළ මිළ 1982 කිලෝග්‍රෑමයක් රුපියල් 23.44 සිට 1983 කිලෝග්‍රෑමයක් රුපියල් 43.27 දක්වා සියයට 85 කින් වැඩි විය). මේ අතර, ලන්ඩන් වෙන්දේසිවලදී අලෙවි වූ ශ්‍රී ලංකා තේ කිලෝග්‍රෑමයක මිළ 1982 දී පැන්ස 107.46 සිට 1983 දී පැන්ස 153.40 දක්වා සියයට 43 කින් වර්ධනය විය. මෙම වාසි සහගත තේ මිළ කෙරෙහි ප්‍රධාන වශයෙන්ම, නිෂ්පාදනය පහත වැටීම සහ නිෂ්පාදනය කරන රටවල පරිභෝජනය ඉහළ යාම නිසා ඇති වූ ඉල්ලුම් සැපයුම් අසමතුලිතතාවය හේතු විය.

තොග තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 8.00 ක්ද පැකට් කළ තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 6.50 ක්ද, මලු තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 1.00 ක්ද, ක්ෂණික තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 13.50 ක්ද, කොළ තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 8.00 ක්ද වශයෙන් පැවති අපනයන බදු අනුපාතිකයන් 1983 ජුලි මස 4 දින සිට බලපැවැත්වෙන පරිදි සියළුම තේ සඳහා කිලෝග්‍රෑමයකට රුපියලකින් වැඩි කරන ලදී.

## 1.37 සංඛ්‍යා සටහන
## 1981—1983 අපනයන සංයුතිය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ 1981 | 1982 | 1983 (ඉ) | විගැහි දශ ලක්ෂ 1981 | 1982 | 1983 | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් 1981 | 1982 | 1983 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. කෘෂිකාර්මික අපනයන .. | 12,170 | 11,656 | 14,554 | 537 | 507 | 579 | 57·8 | 54·3 | 58·0 |
| 1·1 තේ .. | 6,444 | 6,342 | 8,295 | 284 | 276 | 330 | 30·6 | 29·6 | 33·1 |
| 1·2 රබර් .. | 2,889 | 2,323 | 2,852 | 127 | 101 | 114 | 13·7 | 10·8 | 11·4 |
| 1·3 පොල් .. | 1,438 | 1,496 | 1,921 | 64 | 65 | 76 | 6·8 | 7·0 | 7·6 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 1,011 | 1,003 | 1,409 | 45 | 44 | 56 | 4·8 | 4·7 | 5·6 |
| 1·3·2 වෙනත් .. | 427 | 494 | 512 | 19 | 21 | 20 | 2·0 | 2·3 | 2·0 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත(අ) .. | 1,399 | 1,495 | 1,486 | 62 | 65 | 59 | 6·7 | 6·9 | 5·9 |
| 2. කාර්මික අපනයන(අ) (ආ) .. | 7,296 | 8,271 | 8,821 | 322 | 360 | 351 | 34·7 | 38·6 | 35·1 |
| 2·1 රෙදිපිළි හා ඇඟළුම් .. | 3,021 | 3,502 | 4,738 | 133 | 152 | 188 | 14·4 | 16·3 | 18·9 |
| 2·2 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 3,375 | 3,280 | 2,682 | 149 | 143 | 107 | 16·0 | 15·3 | 10·6 |
| 2·3 වෙනත් .. | 900 | 1,489 | 1,401 | 40 | 65 | 56 | 4·3 | 7·0 | 5·6 |
| 3. ඛණිජමය අපනයන .. | 792 | 859 | 1,132 | 35 | 37 | 45 | 3·8 | 4·0 | 4·5 |
| 3·1 මැණික් .. | 633 | 685 | 940 | 28 | 30 | 37 | 3·0 | 3·2 | 3·7 |
| 3·2 වෙනත් .. | 159 | 174 | 192 | 7 | 7 | 8 | 0·8 | 0·8 | 0·8 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 785(ඈ) | 668 | 589 | 35 | 30 | 23 | 3·8 | 3·1 | 2·4 |
| මුළු අපනයන(ආ) | 21,043 | 21,454 | 25,096 | 928 | 934 | 998 | 100·0 | 100·0 | 100·0 |

(අ) විශාල පරිමාවක් ආවරණය වන පරිදි තෝරාගත් අයිතමයන් සංශෝධනය කර ඇත.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රති-අපනයන ඇතුළත්ය.
(ඈ) කැඩි සටහනක් ලැබී නොමැති, 1982 දී රේගුව විසින් සංශෝධිත රුපියල් දශ ලක්ෂ 458 ක (විගැහි දශ ලක්ෂ 20) වටිනාකමින් යුත් අපනයන ඇතුළත්ය.
(ඉ) තාවකාලික.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
රාජ්‍ය මැණික් සංස්ථාව සහ
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

පරිවර්තනාකාවය :
1981 විගැහි 1 = රුපියල් 22·67
1982 විගැහි 1 = රුපියල් 22·98
1983 විගැහි 1 = රුපියල් 25·16

රබර් අපනයන වටිනාකම, 1982 වසරට වඩා 1983 දී රුපියල් දශ ලක්ෂ 529 (විගැහි දශ ලක්ෂ 13) න් සැළකිය යුතු ලෙස වැඩි විය. මෙම වැඩි වීමට මූළුමනින්ම හේතු වූයේ නැ. වි. ස. මිළ 1982 දී කිලෝග්‍රෑමයක් රුපියල් 17.68 සිට 1983 දී කිලෝග්‍රෑමයක් රුපියල් 22.77 දක්වා සියයට 29 න් ඉහළ යාමයි. කෙසේ වෙතත්, අපනයනික රබර් පරිමාව 1982 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 131 සිට 1983 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 125 දක්වා සියයට 5 කින් පහත වැටිණ. 1983 වසරේදී රබර් නිෂ්පාදනය පෙර වසරේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 125 සමග සසඳන විට සියයට 8 ක වැඩි වීමක් පිළිබිඹු කරමින්, කිලෝග්‍රෑම් දශ ලක්ෂ 135 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

කාර්මික රටවල ආර්ථික පුනර්ජීවනය හේතුකොටගෙන, විවරණයට ලක්වන වසර තුළ රබර් සඳහා වැඩි වන ඉල්ලුමක් දිස් විය. මීට අමතරව, 1983 වසරේදී තොග මිළදී ගැනීමක් හෝ මුද හැරීමක් නො වූයෙන් අන්තර් ජාතික ස්වභාවික රබර් සංවිධානයේ තොගද පෙර මට්ටමේම පැවතින. 1983 වසරේදී ද ශ්‍රී ලංකා-චීන වෙළෙඳ සංධානය භාණ්ඩ හුවමාරුව සඳහා කිසිදු විධි විධාන සැළසීමකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, චීනයට අපනයන කරනු ලැබූ රබර් පරිමාව 1982 වසරට වඩා සියයට 100 කින් වැඩි විය. රබර් සඳහා වූ අපනයන බද්ද 1983 ජුනි මසදී කිලෝග්‍රෑමයකට රුපියලක් අඩු කරන ලදී.

1983 වසරේදී පොල් නිෂ්පාදිත අපනයන වලින් ලත් ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 1,921 (විගැහි දශ ලක්ෂ 76) දක්වා සියයට 28 (විගැහි අනුව සියයට 17) න් වැඩි විය. මෙම වැඩි වීමට විශාල වශයෙන් හේතු වූයේ පොල් මද අපනයන වටිනාකම සියයට 40 (විගැහි වටිනාකම් අනුව සියයට 28) න් ඉහළ යාමයි. පොල් අතුරු නිෂ්පාදිත අපනයනද රුපියල් වටිනාකම අනුව සියයට 4 න් වැඩි වූ නමුදු විගැහි වටිනාකම අනුව සියයට 6 න් පහත වැටිණ. සාමාන්‍ය නැ. වි. ස. මිළ මෙන්ම අපනයනික පරිමාව ඉහළ යාම නිසා පොල් මද නිෂ්පාදිත වලින් ලත් අපනයන ඉපැයීම් වැඩි විය. ගෙඩි ගණනින් මිණූ කළ කපාපු පොල්, පොල් තෙල් හා කොප්පරා අපනයන ප්‍රමාණය 1982 දී ගෙඩි දශ ලක්ෂ 569 සිට 1983 දී ගෙඩි දශ ලක්ෂ 582 දක්වා ඉහළ ගිය අතර ගෙඩියක සාමාන්‍ය නැ. වි. ස. මිළ රුපියල් 1.76 සිට රුපියල් 2.42 දක්වා වැඩි විය. විවරණයට ලක් වන වසර තුළදී, පොල් නිෂ්පාදිත අපනයනය බලපත්‍ර ක්‍රමය යටතට ගෙනෙන ලදී.

ප්‍රධාන අපනයන භෝග තුනෙන් ලත් ඉපැයීම් ඉහළ ගිය නමුදු, සුළු කෘෂිකාර්මික අපනයනයන්හි ක්‍රියාකාරිත්වය අයහපත් විය. මෙම භාණ්ඩ අපනයනයෙන් ලත් ඉපැයීම්, විගැහි වටිනාකම් අනුව ගත වූ වසරේ සියයට 5 වර්ධනය හා සසඳන විට සියයට 10 න් අඩු විය. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කුරුඳු, පුවක්, කරඳමුංගු, තල ඇට, බුලත් සහ සකස් නොකළ දුම්කොළ අපනයන පහත වැටීමයි.

1983 දී කාර්මික අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 8,821 (විගැහි දශ ලක්ෂ 351)ක් වූ අතර, එය 1982 වසරේ රුපියල් දශ ලක්ෂ 8,271 (විගැහි දශ ලක්ෂ 360) සමග සැසඳීමේදී රුපියල් වටිනාකම අනුව සියයට 7 ක වැඩි වීමක් සහ විගැහි වටිනාකම අනුව සියයට 3 ක පහත වැටීමක් පෙන්විය. කෙසේ වෙතත්, රෙදිපිළි අපනයන වටිනාකම 1982 දී රුපියල් දශ ලක්ෂ 3,502 (විගැහි දශ ලක්ෂ 152) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 4,738 (විගැහි දශ ලක්ෂ 188) දක්වා රුපියල් මෙන්ම විගැහි වටිනාකම් අනුවද සැළකිය යුතු අන්දමින් වැඩි විය. මේ අනුව, මුළු අපනයන වලින් එහි පංගුව 1982 දී සියයට 16 සිට 1983 දී සියයට 19 දක්වා වැඩි විය. 1983 වසරේදී, මහ කොළඹ ආර්ථික කොමිසමේ බල ප්‍රදේශය තුළ ආයෝජකයන් විසින් කරනු ලැබූ ඇඟළුම් අපනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,836 (විගැහි දශ ලක්ෂ 73) ලෙස ඇස්තමේන්තු කර ඇත.

1983 වසරේදී කාර්මික භාණ්ඩ කාණ්ඩයෙහි අනෙක් ප්‍රධාන ද්‍රව්‍ය දෙවර්ගයේ එනම් ඛණිජ තෙල් නිෂ්පාදිත හා අනෙකුත් කාර්මික භාණ්ඩවල අපනයන වටිනාකම තියුණු ලෙස පහත වැටිණ. ඛණිජ තෙල් නිෂ්පාදිත සියයට 18 (විගැහි අනුව සියයට 25) න් අඩු වූ අතර අනෙකුත් කාර්මික භාණ්ඩ සියයට 6 (විගැහි අනුව සියයට 15) න් පහත වැටිණ. අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් සඳහා 1983 ජනවාරි සහ පෙබරවාරි මාසවල ඛණිජ තෙල් පිරිපහදුව වසා තැබීම, ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය.

ඛනිජමය අපනයන වලින් ලත් ඉපැයීම් සියයට 32 (විගැහි අනුව සියයට 20)ක වර්ධනයක් වාර්තා කරමින්, 1982 දී රුපියල් දශ ලක්ෂ 859 (විගැහි දශ ලක්ෂ 37) සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 1,132 (විගැහි දශ ලක්ෂ 45) ක් දක්වා වැඩිවීමක් පෙන්විය. මෙම වැඩි වීම කෙරෙහි සියයට 37 (විගැහි අනුව සියයට 25) න් වැඩි වූ මැණික් අපනයන ඉපැයීම් බොහෝසෙයින්ම හේතු විය. කෙසේ වෙතත්, මෙයට කැපීම සහ ඔප දැමීම සඳහා ආනයනය කරනු ලැබූ දියමන්ති ප්‍රති-අපනයන වටිනාකමද ඇතුළත්ය.

1983 වසරේදී අපනයන අංශයේ සමස්ථ ක්‍රියාකාරිත්වය ඉකුත් වසරට වඩා වාසිදයක විය. කෙසේ වෙතත් තේ, රබර් සහ පොල් මිළ වැඩි නොවූයේ නම්, අපනයන අංශයේ සෘණ වර්ධනයක් වාර්තාවීමට ඉඩ තිබුණු බව සඳහන් කළ යුතුය. ඒ අනුව ඉහළ අපනයන මිළ නිසා අවාසිදයක උපනතීන් රැසක් සමහන් විය. තේ සහ රබර් අපනයන පරිමාව අඛණ්ඩව පහත වැටුණි. සුළු කෘෂිකාර්මික භෝග සහ ආහාර, බීම වර්ග, දුම්කොළ සහ රසායන ද්‍රව්‍ය වැනි අනෙකුත් කාර්මික අපනයනවල ඉපැයීම් අඩු වීමෙන්, පාරම්පරික නොවන අපනයනවල පසු බැසීමක් පෙන්වී ය. ඇඟළුම් අපනයනවල සැලකිය යුතු වර්ධනය දෙස ද බැලිය යුත්තේ එහි අන්තර්ගත ඉහළ ආනයන යෙදවුම් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය අගය එකතු කිරීම අඩුවීම ද සැලකිල්ලට ගනිමිනි.

**ආනයන**

1982 වසරේ ආනයන වියදම වූ රුපියල් දශ ලක්ෂ 41,946 සමග සසඳන විට 1983 මුළු ආනයන වියදම (ගලපන ලද සංඛ්‍යා) රුපියල් දශ ලක්ෂ 45,553 දක්වා වැඩි විය. රුපියල් වටිනාකම් අනුව, පසුගිය වසරට වඩා අඩු ප්‍රතිශතක ප්‍රමාණයකින් ආනයන වියදම වැඩි වූ අතර, වඩාත් ස්ථායී විගැහි වටිනාකම් අනුව ආනයන වියදම සියයට 1 න් පහත වැටුණි. විගැහි වටිනාකම් අනුව ආනයන පහත වැටීම තුළින්, ඛනිජ තෙල් ආනයන සහ ගමනාගමන උපකරණ ආනයන පහත වැටීම පිළිබිඹු විය.

විගැහි වටිනාකම් අනුව 1982 වසරේ සියයට 13 ක ආනයන වර්ධනයක් පෙන්නුම් කළද, එය මෙම වසර තුළ කැපී පෙනෙන ලෙස අඩු විය. ආනයන සංයුතියේ ව්‍යුහාත්මක වෙනස්වීම්, පසුගිය වසර කීපයේ දක්නට ලැබුණු ස්වරූපයෙන් බැහැර වීමක් පෙන්නුම් කරන ලදී. විවරණයට භාජනය වන වසර තුළ පාරිභෝගික භාණ්ඩ පංගුව, 1982 දී පැවැති සියයට 21 සිට සියයට 26 දක්වා වැඩි වූ අතර, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ පංගු, පිළිවෙලින් මෙම වසර දෙක තුළ සියයට 52 සිට සියයට 48 දක්වාත්, සියයට 28 සිට සියයට 27 දක්වාත් අඩු විය. පාරිභෝගික භාණ්ඩයන්ගේ වියදම වැඩිවීම කෙරෙහි විශාල වශයෙන් හේතු වූයේ රෙදිපිළි, කිරි ඇතුළු අනෙකුත් ආහාර සහ සීනි ආනයනයන්ගේ වර්ධනයන්ය.

රුපියල් වටිනාකම් අනුව පෙර වසරට වඩා සියයට 4 ක වැඩි වීමක් වාර්තා කරමින් 1983 වසර තුළ ආයෝජන භාණ්ඩ ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 12,077 (විගැහි දශ ලක්ෂ 480) ක් විය. එහෙත් විගැහි වටිනාකම් අනුව එය සියයට 5 න් පහත වැටුණි. 1983 වසර තුළදී, ආයෝජන භාණ්ඩයන්ගෙන් සියයට 43 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි

ද්‍රව්‍ය අනු කාණ්ඩයේ ආනයන වියදම් ද සැළකිය යුතු වැඩිවීම් වාර්තා කරන ලදී. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වටිනාකම 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 3,964 (විගැහි දශ ලක්ෂ 173) සිට 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 5,261 (විගැහි දශ ලක්ෂ 209) දක්වා වැඩි වූ අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වටිනාකමද 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 557 (විගැහි දශ ලක්ෂ 24) සිට 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 1,177 (විගැහි දශ ලක්ෂ 47) දක්වා වැඩි විය. ගමනාගමන උපකරණ වියදම 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 5,529 (විගැහි දශ ලක්ෂ 241) සිට 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 3,826 (විගැහි දශ ලක්ෂ 152) දක්වා කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කරන ලදී. රුපියල් දශ ලක්ෂ 1,602 ක (විගැහි දශ ලක්ෂ 64) මුළු වටිනාකමින් යුත් ගුවන්යානා සහ නැව් ආනයනයන්ද මෙයට ඇතුළත් වේ. රුපියල් දශ ලක්ෂ 3,456 ක වටිනාකමින් යුත් නැව් පහක් සහ ගුවන් යානා දෙකක් ආනයන කිරීමෙන් 1982 වසරේ ගමනාගමන හා උපකරණ අංශයේ වූ ප්‍රසාරණාත්මක වර්ධනය, 1983 වසරේ මෙම අංශයේ තියුණු පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. නැව් සහ ගුවන්යානා හැරුණු විට අනෙකුත් ගමනාගමන උපකරණ ආනයනයන් ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළ අතර, අනෙකුත් ආයෝජන භාණ්ඩ ආනයනයන්ද වැඩි විය.

රුපියල් දශ ලක්ෂ 21,722 ක් වූ (විගැහි දශ ලක්ෂ 864) අන්තර් භාණ්ඩ ආනයන වියදම, පෙර වසරට වඩා ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළ අතර, විගැහි වටිනාකම් අනුව සියයට 8 න් පහත වැටුණි. රුපියල් වටිනාකම් අනුව තිරිඟු ඇට ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,340 ක් (විගැහි දශ ලක්ෂ 93) වීමෙන් සියයට 31 න් වැඩිවූ අතර, පොහොර සහ රසායනික ද්‍රව්‍ය වටිනාකම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 620 ක් (විගැහි දශ ලක්ෂ 25) සහ රුපියල් දශ ලක්ෂ 832 ක් (විගැහි දශ ලක්ෂ 33) වීමෙන් සියයට 11 න් සහ සියයට 14 න් වැඩි විය. එහෙත් විගැහි වටිනාකම් අනුව වැඩි වූයේ පහළ ප්‍රතිශතකයන්ගෙනි. තිරිඟු ඇට ආනයනයන්ගේ වටිනාකමේ වැඩිවීම කෙරෙහි ආනයන පරිමාවේ වැඩිවීම සහ මි.හා.ගැ. මිළෙහි වැඩිවීමද හේතු විය. බනිජ තෙල් ආනයන වටිනාකම, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 12,274 (විගැහි දශ ලක්ෂ 534) සිට විවරණයට භාජනය වන වසර තුළ රුපියල් දශ ලක්ෂ 11,024 (විගැහි දශ ලක්ෂ 438) දක්වා සියයට 10 න් (විගැහි සියයට 18) අඩුවී මුළු අන්තර් භාණ්ඩ ආනයනයන්ගෙන් සියයට 51 ක් හා මුළු ආනයනයන්ගෙන් සියයට 24 ක් විය. ආනයනික පරිමාවෙහි හා සාමාන්‍ය මි.ර.ගැ. මිළ යන දෙකෙහිම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බනිජ තෙල් ආනයන වියදම අඩු විය. ආනයන පරිමාව සියයට 23 න් පහත වැටුණු අතර, බොර තෙල් බැරලයක සාමාන්‍ය මි.ර.ගැ. මිළ 1982 දී වූ ඇ.එ.ජ. ඩොලර් 34 සිට විවරණයට භාජනය වන වසර තුළ ඇ.එ.ජ. ඩොලර් 30 දක්වා අඩුවිය.

පසුගිය දෙ වසර තුළ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම මූර්ත වශයෙන් පහත වැටුණු අතර, රුපියල් වටිනාකම් අනුව, පසුගිය වසරට වඩා සියයට 35 න් වැඩිවී (විගැහි අනුව සියයට 23) විවරණයට භාජනය වන වසර තුළදී රුපියල් දශ ලක්ෂ 11,639 ක් (විගැහි දශ ලක්ෂ 463) විය. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම වැඩිවීම කෙරෙහි ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් ආනයන වියදම්හි වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර හා පාන වර්ග ආනයන වටිනාකම 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 3,561 (විගැහි දශ ලක්ෂ 155) සිට රුපියල් දශ ලක්ෂ 5,375 (විගැහි දශ ලක්ෂ 214) දක්වා රුපියල් වටිනාකම් අනුව සියයට 51 න් සහ විගැහි වටිනාකම් අනුව සියයට 38 න් සැළකිය යුතු ලෙස වැඩිවූ අතර, රෙදිපිළි හා ඇඟළුම 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 2,167 (විගැහි දශ ලක්ෂ 94) සිට 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 2,724 (විගැහි දශ ලක්ෂ 108) දක්වා රුපියල් වටිනාකම් අනුව සියයට 26 න් හා විගැහි වටිනාකම් අනුව සියයට 15 න් වැඩි විය. 1982 දී රුපියල් දශ ලක්ෂ 970 (විගැහි දශ ලක්ෂ 42) ක්වූ සීනි සඳහා වූ වියදම දෙ ගුණයකටත් වඩා වැඩි වෙමින් විවරණයට භාජනය වන වසරෙහිදී රුපියල් දශ ලක්ෂ 1,985 ක් (විගැහි දශ ලක්ෂ 79) විය. මෙය සම්පූර්ණ වශයෙන්ම ආනයන පරිමාවේ කැපී පෙනෙන සුළු වැඩිවීම නිසා සිදු වූ අතර, සාමාන්‍ය මි.ර.ගැ. මිළ පහත වැටුණි.

## 1 . 38 සංඛ්‍යා සටහන

## 1981—1983 ආනයනයන්හි අවසන් උපයෝජන වර්ගීකරණය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු ආනයනයන්ගේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 1982 (අ) | 1983 (ආ) | 1981 | 1982 | 1983 | 1981 | 1982 | 1983 |
| 1· පාරිභෝගික භාණ්ඩ .. .. | 9,219 | 8,616 | 11,639 | 406·7 | 375·0 | 462·7 | 25·2 | 20·5 | 25·6 |
| 1·1 ආහාර සහ පාන වර්ග .. .. | 4,888 | 3,561 | 5,375 | 215·6 | 155·0 | 213·7 | 13·4 | 8·5 | 11·8 |
| 1·1·1 සහල් .. .. | 992 | 925 | 765 | 43·8 | 40·3 | 30·4 | 2·7 | 2·2 | 1·7 |
| 1·1·2 පිටි .. .. | 28 | 62 | 108 | 1·2 | 2·7 | 4·3 | 0·1 | 0·2 | 0·2 |
| 1·1·3 සීනි .. .. | 2,826 | 970 | 1,985 | 124·7 | 42·2 | 78·9 | 7·7 | 2·3 | 4·4 |
| 1·2 රෙදිපිළි හා ඇඟළුම් .. .. | 2,334 | 2,167 | 2,724 | 103·0 | 94·3 | 108·3 | 6·4 | 5·2 | 6·0 |
| 1·3 වෙනත් .. .. | 1,997 | 2,888 | 3,540 | 88·1 | 125·7 | 140·7 | 5·5 | 6·9 | 7·8 |
| 2· අන්තර් භාණ්ඩ .. .. | 19,275 | 21,640 | 21,722 | 850·3 | 941·8 | 863·5 | 52·7 | 51·6 | 47·7 |
| 2·1 ඛනිජ තෙල් .. .. | 9,958 | 12,274 | 11,024 | 439·3 | 534·2 | 438·2 | 27·2 | 29·3 | 24·2 |
| 2·2 පොහොර .. .. | 1,202 | 560 | 620 | 53·0 | 24·4 | 24·7 | 3·3 | 1·3 | 1·4 |
| 2·3 රසායනික ද්‍රව්‍ය .. .. | 663 | 729 | 832 | 29·2 | 31·7 | 33·1 | 1·8 | 1·7 | 1·8 |
| 2·4 තිරිඟු .. .. | 1,697 | 1,787 | 2,340 | 74·9 | 77·8 | 93·0 | 4·6 | 4·3 | 5·1 |
| 3· ආයෝජන භාණ්ඩ .. .. | 7,956 | 11,591 | 12,077 | 351·0 | 504·5 | 480·1 | 21·7 | 27·6 | 26·5 |
| 3·1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ .. | 3,876 | 3,964 | 5,261 | 171·0 | 172·5 | 209·1 | 10·6 | 9·5 | 11·6 |
| 3·2 ගමනා ගමන උපකරණ (ඇ) .. | 2,229 | 5,529 | 3,826 | 98·3 | 240·6 | 152·1 | 6·1 | 13·2 | 8·4 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය .. .. | 525 | 557 | 1,177 | 23·2 | 24·2 | 46·8 | 1·4 | 1·3 | 2·6 |
| 4· වර්ග නොකරන ලද .. .. | 132 | 99 | 115 | 5·8 | 4·3 | 4·6 | 0·4 | 0·2 | 0·2 |
| මුළු අපනයන (ඈ) .. .. | 36,582 | 41,946 | 45,553 | 1,613·8 | 1,825·6 | 1,810·9 | 100·0 | 100·0 | 100·0 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) රේගු වාර්තාවේ සඳහන් නොවූ නැව් සහ ගුවන් යානා වටිනාකම් ඇතුළත්ය.
(ඈ) ගලපන ලද.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන ආනයන කරුවෝ,
ලංකා ඛනිජ තෙල් සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

ආනයන වියදම් වැඩිවීම් සටහන් කළ අනෙකුත් ද්‍රව්‍යයන් අතර කිරි හා කිරි ආහාර ද්‍රව්‍ය, මාළු නිෂ්පාදිත සහ අනෙකුත් ආහාර ද්‍රව්‍යයන් විය. රෙදිපිළි හා ඇඟළුම් ආනයන වියදම් වැඩිවීම කෙරෙහි නිදහස් වෙළෙඳ කලාපයේ හා ඉන් පිටත ඇඟළුම් කර්මාන්තය සඳහා අමු ද්‍රව්‍ය වශයෙන් ආනයන කරන ලද රෙදිපිළි පරිමාව වැඩිවීම හේතු විය. (සියළුම රෙදිපිළි ආනයනයන් පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇත. එම නිසා මුළු ආනයනයන්ගෙන් පාරිභෝගික හා අන්තර් භාණ්ඩයන්ගේ කොටස විධිමත් කිරීමක් කළ යුතුවේ.).

නිෂ්කාශන අවස්ථාවේදී ගෙවීම් මාධ්‍යය අනුව රේගුව මගින් ආනයනයන් වර්ග නොකරනු ලබන හෙයින් විදේශ ආධාර මත කරනු ලබන ආනයන පිළිබඳව වෙනම වාර්තා නොමැත. කෙසේ වෙතත් විදේශ ආධාර ලබාගැනීමේදී පවත්නා දත්තයන් මත, මුළු ආනයනයන්ගෙන් සැළකිය යුතු කොටසක් වන ආධාර ආනයනයන් දළ වශයෙන් ඇස්තමේන්තු කළ හැකිය.[1] 1982 වසර සඳහා වූ රුපියල් දශ ලක්ෂ 7,970 (විගැහි දශ ලක්ෂ 347) සමග සසඳමින් 1983 වසර සඳහා ආධාර ආනයනයන් දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 9,566 ක් (විගැහි දශ ලක්ෂ 380) වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව මුළු ආනයනයන්ගේ ප්‍රතිශතයක් වශයෙන් ආධාර ආනයනයන්හි ප්‍රමාණය 1982 දී වූ සියයට 19 සිට විවරණයට භාජනය වන වසර තුළ සියයට 21 දක්වා ඉහළ ගියේය.

**1 . 39 සංඛ්‍යා සටහන**

**1983—ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

(මෙට්‍රික් ටොන්)

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛනිජ තෙල් (බොර තෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි .. | 32,052 | 37,000 | 39,200 | 191,055 | 10,000 |
| පෙබරවාරි .. | 17,269 | ... | 29,300 | — | 12,770 |
| මාර්තු .. | 18,308 | 109,035 | 74,787 | — | 17,200 |
| අප්‍රේල් .. | 11,230 | 44,578 | 13,000 | 213,967 | 24,250 |
| මැයි .. | 4,975 | 54,616 | 7,101 | — | 16,150 |
| ජූනි .. | 75 | — | 9,476 | 242,090 | 550 |
| ජූලි .. | 29,169 | 57,258 | 6,009 | 29,443 | 4,530 |
| අගෝස්තු .. | 18 | 62,098 | 9,283 | 227,856 | 34,940 |
| සැප්තැම්බර් .. | 17,132 | 68,317 | 27,600 | 186,747 | 37,535 |
| ඔක්තෝබර් .. | 7,854 | 51,336 | 22,050 | 29,481 | 25,000 |
| නොවැම්බර් .. | 4,917 | 2,834 | 33,434 | 186,543 | 8,600 |
| දෙසැම්බර් .. | 6,989 | 88,547 | 45,843 | 184,791 | 12,720 |
| එකතුව (අ) (ආ) .. | 146,973 | 578,538 | 314,876 | 1,491,973 | 204,245 |

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ගලපන ලද.
(ආ) පසුව කරන ලද ගැලපීම් හේතුවෙන් මාසික දත්තයන්ගේ එකතුව වාර්ෂික මුළු එකතුවට සමාන නොවිය හැක.

1. යෝජනා ක්‍රම ආධාරවල සංගුණිකයට සම්පූර්ණ ද්‍රව්‍යාධාරද, ආහාර ආධාර සහ ජා. මූ. අ. භාරකාර අරමුදල් ණයද එකතු වීමෙන් ආධාර ආනයනයන්හි වටිනාකම සැකසී ඇත. ආධාර ඇස්තමේන්තු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් අංශයේ පවත්නා වාර්තා මත පදනම් වී ඇත.

**විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

1977 වසරෙහි හඳුන්වා දෙනු ලැබූ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය 1983 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ආනයනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඍජු පාලනයන්ගෙන් තොරව පැවති අතර, ආර්ථිකයේ අඛණ්ඩ ප්‍රසාරණය දිගටම පවත්වා ගැනීමේදී අපනයන වර්ධනය වැදගත් අවශ්‍යතාවයක් ලෙස සළකන ලදී. කෙසේ වෙතත්, 1983 වසරේ අපනයන අංශයේ වර්ධනය පසුබෑස්මක් සටහන් කරන ලදී. තේ සහ රබර් අපනයන පරිමාව පහත වැටුණු අතර, 1982 වසරේ පැවති මට්ටමට වඩා සුළු කෘෂිකාර්මික භෝග අපනයනයන්ද සැළකිය යුතු ලෙස පහත වැටුණි. මිළ වැඩිවීම මගින් මෙකී අඩුපාඩුකම් මගහැරී ගියද අපනයනය සඳහා නිෂ්පාදනය වැඩිකිරීමේ අවශ්‍යතාවය අවධාරණයෙන් බැහැර කළ නොහැකිය.

1983 වසර තුළ මුළු ආනයන වියදම පහත වැටුණි. ආනයන අපනයන පරතරය පෙර වසරට වඩා අඩු විය. විගැහි දශ ලක්ෂ 813 ක් වූ 1983 වසරේ මුළු වෙළෙඳ හිඟයෙන් විගැහි දශ ලක්ෂ 380 ක් ආධාර වශයෙන් ගණනය කළ හැකිය.

ප්‍රමුඛ අංශ වලට ණය ගලා යාමට සැලැස්වීමේ අරමුණ ඇතිව, ණය දෙනු ලබන ආයතන වලින් අනුමත කරනු ලබන ණය ප්‍රමාණය හා ඒවායේ දිශාවන් හැසිරවීමට මහ බැංකුව ක්‍රියා කළ අතර, ණය සඳහා සමස්ථ ඉල්ලුම යහපත් මට්ටමක පවත්වාගෙන යාමටද කටයුතු කරන ලදී. පෙර වසර වලදී මෙන්ම අපනයන මූල්‍යකරණය සඳහා ප්‍රමුඛත්වය ලැබිණි. අපනයන ණය සැපයීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පිළිවෙත් පිළිබඳ වැඩිමනත් විස්තර මෙම වාර්තාවේ මුදල් හා බැංකු ක්‍රම පිළිබඳ කොටසෙහි ඉදිරිපත් කර ඇත.

අපනයන වර්ධන ප්‍රතිපත්ති සැකසීමේ ප්‍රධාන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ස්වකීය කර්තව්‍යයන් අඛණ්ඩව කරගෙන යන ලදී. අපනයන සංවර්ධන අමාත්‍ය සභාවේ මග පෙන්වීම යටතේ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු විය. අපනයන සේවා ශක්තිමත් කිරීමට මෙන්ම අපනයන සැපයීම් කෙරෙහි බලපානු ලබන බාධක හඳුනා ගැනීමට ද මණ්ඩලය තවදුරටත් මූලිකත්වය දෙන ලදී. එසේම අපනයනිකයන්ට, ණය දෙන ආයතන මගින් මධ්‍ය හා දිගු කාලීන ව්‍යාපෘති මූල්‍යකරණයන් සහන කොන්දේසි මත ලබා දීම සඳහා මණ්ඩලය දැඩි ලෙස සහාය විය. 1983 වසරේදී වාණිජ බැංකු සහ මහ බැංකුව විසින් මූල්‍යකරනු ලැබීම සඳහා ව්‍යාපෘතීන් 159 ක් මණ්ඩලය මගින් නිර්දේශ කරන ලදී. මණ්ඩලය විසින් කරනු ලැබූ ප්‍රාග්ධන ආයෝජනය 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 3.4 සමග සසඳන විට 1983 වසරේදී ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 17 ක් පමණ විය. අපනයන ඉපැයීම් වැඩිවීම මත පදනම් වූ අපනයන වර්ධන ප්‍රදාන ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 129 ක් වසර තුළදී අපනයනිකයන්ට ගෙවනු ලැබීය. නිෂ්පාදිත 193 ක් රේගු බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය යටතේ වූ අතර, මෙම යෝජනා ක්‍රමය යටතේ 1983 වසර තුළ රුපියල් දශ ලක්ෂ 836 ක් අපනයනිකයන්ට ආපසු ගෙවනු ලැබීය. මෙම වසර තුළදී රේගු බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය ව්‍යාපාර පිරිවැටුම් බදු මෙන්ම අනෙකුත් බදු වර්ගද ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන ලදී.

අපනයන සංවර්ධන ගම්මාන වලදී (අ.ස.ග.) ග්‍රාමීය මට්ටමෙන් අපනයන සඳහා නිෂ්පාදනය කිරීම වැඩි කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙම වැඩ පිළිවෙල යටතේ වසර තුළදී අපනයන නිෂ්පාදිත ගම්මාන සමාගම් 12 ක් ලියාපදිංචි කරනු ලැබීය. මෙකී අ.ස.ග. සමාගම්හි කොටස් හිමියන් ගමේ ම අය විය.

1983–1987 කාලසීමාව ආවරණය වන ජාතික අපනයන සංවර්ධන සැලැස්ම 1983 වසරේදී සකසා නිම කරන ලදී. මෙම කාලසීමාව තුළ වාර්ෂිකව සියයට 11 ක සාමාන්‍ය අපනයන වර්ධනයක් මෙම සැළසුම මගින් බලාපොරොත්තු වනු ලැබේ. රුපියල් දශ ලක්ෂ 12,000 ක් පමණ අපනයන සංවර්ධනය සඳහා ආයෝජනය වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, මෙයින් සියයට 60 ක් පෞද්ගලික අංශයෙන් සැපයෙතැයි බලාපොරොත්තු වනු ලැබේ.

විවරණයට භාජනය වන වසර තුළ දී ද ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රී.ලං.අ.ණ.ර.සං.) අපනයන ණය සහතික කිරීම සහ රක්ෂණය කිරීම මගින් ස්වකීය අපනයන වර්ධන කර්තව්‍යයන් නොකඩවා ඉදිරියට ගෙන යනු ලැබිය. වසර අවසානයේදී මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය 232 ක් බවට පත් කරමින් 1983 වසරේදී රුපියල් දශ ලක්ෂ 47.2 ක වටිනාකමින් යුත් නව රක්ෂණ ඔප්පු 23 ක් නිකුත් කරන ලදී. මෙකී රක්ෂණ ඔප්පුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 403.4 ක් වූයේ වටිනාකම අනුව සියයට 13 ක වැඩිවීමක් සටහන් කරමිනි. වසරකට පෙර බලපැවැත් වූ රුපියල් දශ ලක්ෂ 963 ක වටිනාකමින් යුත් ඇපකර 417 සමග සසඳන විට, 1983 අවසානයේ රුපියල් දශ ලක්ෂ 1,020 ක වටිනාකමින් යුත් ඇපකර 440 ක් බලපැවැත්විණි. මේ සඳහා පූර්ව හා පශ්චාත් නැව්ගත කිරීම් සහ අපනයන කුසලතා ඇපකරද ඇතුළත් විය. ඇඟළුම් කාණ්ඩය සඳහා නිකුත් කරනු ලැබූ ඇපකර ප්‍රමාණයෙන් මෙන් ම වටිනාකමින්ද විශාල විය. සංස්ථාවේ ක්‍රියාකාරිත්වය අපනයනිකයනට විදේශ වෙළෙඳ පොළෙහි තරගකාරීවීම සඳහා මහෝපකාරී විය.

වසර තුළ ආනයන අපනයන පාලන ප්‍රතිපත්තිවල සැළකිය යුතු වෙනසක් සිදු නොවිය. තීරු ගාස්තු හා අනෙකුත් බදු සහ අවම අපනයන මිළයන්හි සමහර සංශෝධන හැරුණු විට ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන් පාලනයෙන් තොරව පැවතුණි. වසර තුළදී එක්කල කුරුඳු පොතු හා කුරු සහ පොල් නිෂ්පාදිත ඇතුළත්ව අයිතමයන් 21 ක් අපනයන බලපත්‍ර යටතේ පැවති අතර, අයිතමයන් සුළු ප්‍රමාණයක් පූර්ව අපනයන තත්ව ප්‍රමිති පරීක්ෂණයන් යටතේ පැවතුණි. වසර ආරම්භයේ දී අපනයන බලපත්‍ර යටතට පත්ව තිබූ අයිතමයන්ට අමතරව යකඩ හා වානේ, සිමෙන්ති සහ යන්ත්‍ර සූත්‍ර යනාදියෙහි සමහර අයිතමයන් බලපත්‍ර යටතට ගෙන එනු ලැබූ අතර, මාළු නිෂ්පාදිත සමහරක් සහ මුද්‍රණ කඩදාසි බලපත්‍ර ක්‍රමයෙන් නිදහස් කරනු ලැබිය.

ජාත්‍යන්තර මිළ ගණන් ඉහළ යාමෙන් නැව්ගත කරන්නන්ට සැලසෙන විශාල වාසියෙන් කොටසක් රජයට ලබා ගැනීම අරමුණු කර ගනිමින් ජූලි මාසයේදී තේ කිලෝග්‍රෑමයක් සඳහා වූ අපනයන බද්ද රුපියලකින් වැඩි කරන ලදී. මෙමගින් තොග තේ කිලෝග්‍රෑමයක් සඳහා බද්ද රු. 9.00 ක් දක්වා වැඩි වුවද, සැලකිය යුතු හා වැඩිවන අන්තරයක් වෙළෙඳුන්ට ලැබුණු අතර මුළු නැ.වි.ස මිළෙන් රජය බදු වශයෙන් ලබා ගත් පංගුව පහත වැටුණි. මිළ වාසියෙන් සාධාරණ කොටසක් තේ කර්මාන්තයේ දිගු කාලීන සංවර්ධනය සඳහා යෙදවීමේ අරමුණින් තේ වෙන්දේසි අවස්ථාවේ අයකරනු ලබන බද්ද මෙන්ම සංවර්ධන සෙස් බද්ද ද, විවරණයට භාජනය වන වසරේ දෙවෙනි භාගයේදී වැඩි කරන ලදී. එසේම අපනයන ප්‍රසාරණයකදී සිදුවිය හැකි උද්ධමනාත්මක ප්‍රතිඵලයන් අඩු කිරීම සඳහාද මෙවැනි ක්‍රියාමාර්ගයන් හේතු විය හැකිය.

රබර් අපනයන සම්බන්ධයෙන් අනුක්‍රමික පරිමාණ බදු ක්‍රමය ක්‍රියාත්මකව පැවතුණි. ජාත්‍යන්තර මිළ හැසිරීම් සහ නිෂ්පාදන වියදම් ඉහළ යාම සලකා බලමින් 1983 ජූනි මාසයේදී රබර් කිලෝග්‍රෑමයක් සඳහා වූ බදු මට්ටම්, ආසන්න වශයෙන් රුපියලකින් පහත හෙලනු ලැබූ අතර, 1983 ජූලි මාසයේදී රබර් කිලෝග්‍රෑමයක් සඳහා වූ සෙස් බද්ද රුපියල් 0.85 සිට රුපියල් 1.36 දක්වා වැඩි කරන ලදී. එසේම වසර තුළ රබර් අපනයනයන්ද නිදහස්ව පැවතුණි. පොල් අපනයන සම්බන්ධයෙන්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිළ වෙනස්වීම් වලට අනුකූලව බදු ප්‍රමාණයන් ස්වයංක්‍රියව වෙනස්වන පරිදි සියළුම පොල් මද නිෂ්පාදිතයන් සඳහා අනුක්‍රමික පරිමාණ බදු ක්‍රමය දිගටම ක්‍රියාත්මක විය. මද නිෂ්පාදිත සම්බන්ධයෙන් වූ අනුක්‍රමික පරිමාණ බදු ක්‍රමය හැරුණු විට දශ නොකැවූ රළු කොහු කෙඳි සඳහා සියයට 15 ක ස්ථාවර බද්දක් අයකරනු ලැබිය.

ස්වාභාවික මිනිරන් සඳහා සියයට 25 ක අපනයන තීරු බද්දක් ද, කුරුඳු සඳහා සියයට 5 සිට 10 දක්වා වූ තීරු බද්දක් ද විය. අදාළ බලධාරීන් විසින් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මිළ හැසිරීම් සැළකිල්ලට ගනිමින්, පොල් නිෂ්පාදිත සහ ඇතැම් සුළු කෘෂිකාර්මික අපනයන සම්බන්ධයෙන් පනවන ලද අවම අපනයන මිළ ගණන් කාලානුරූපව සංශෝධනය කරන

ලදී. පොල් තෙල් සහ කපාපු පොල් සඳහා වසර ආරම්භයේ ක්‍රියාත්මකව පැවති මිල ආධාර ක්‍රම, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මෙම නිෂ්පාදිතයන්ගේ මිල ගණන් ඉහළ ගිය බැවින් අනවශ්‍ය බවට පත් විය.

අඩු අපනයන තීරු බදු සහ මිල ආධාර ක්‍රම සඳහා වූ අවශ්‍යතාව පසුගිය වසර වලට වඩා අඩු විය. කෙසේ වෙතත්, වැඩිවන නිෂ්පාදන පිරිවැය හමුවෙහි අපනයන ව්‍යාපාරයන් හි නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීමේ අවශ්‍යතාවය එසේම පැවතින. ප්‍රධාන අපනයන භාණ්ඩවල මිල ගණන් මෙතෙක් නොවූ විරූ මට්ටම් කරා ඉහළ ගොස් ඇතත්, නිතර අපනයන මිල ගණන් වෙනස්වීම සහ විශේෂයෙන්ම මිල ගණන්හි තියුණු පහළ බැසීම් වැළැක්වීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාවය තුළින් ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය තවමත් පවතී.

මෑත අතීතයේ මෙන්ම, සියයට 5 සිට 500 දක්වා වූ ආනයන බදු වසර තුළදී බලපැවැත්වූයේ ආදායම් වැඩි කිරීම හා දේශීය කර්මාන්ත වලට ප්‍රමාණවත් ආරක්ෂාව සැළසීමටත්ය. වසර ආරම්භයේ දී අමු ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර ආනයනයන් බොහොමයක් සියයට 5 සිට 12½ දක්වා බද්දකට යටත්වූ අතර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය තීරුබදු වලින් නිදහස්ව පැවතුණි. නමුත් 1983 පෙබරවාරි මස දී සියළුම ආනයන ද්‍රව්‍යයන්ට බලපාන පරිදි තීරු බදු අනුපාතයන්හි සාමාන්‍ය වැඩිවීමක් සිදුවිය. තීරුබදු වලින් නිදහස්ව පැවති ද්‍රව්‍යයන් සියයට 5 ක තීරු බද්දකට යටත්වූ අතර, සියයට 25 ට අඩුවෙන් තීරුබදු ගෙවිය යුතුව පැවති භාණ්ඩ සඳහා තවත් සියයට 2½ න් බදු වැඩි කිරීමත්, සියයට 25 සහ 100 අතර වූ අනුපාතයන් තවත් ප්‍රතිශතක 10 න් වැඩි කරනු ලැබීමත්, සිදු විය. සියයට 100 න් හෝ ඊට වඩා බදු ගෙවිය යුතු වූ භාණ්ඩ සඳහා කිසිදු වෙනසක් සිදු නොකරන ලදී. මෙම සාමාන්‍ය බදු වැඩි කිරීමට අමතරව, වසර තුළදී විශේෂිත ප්‍රතිශෝධනයන් ද සිදු කරන ලදී. පාරිභෝගිකයා සඳහා සාධාරණ මිලක් පවත්වා ගැනීම පිණිස, සීනි ආනයන සඳහා වූ තීරු බද්ද 1983 පෙබරවාරි මාසයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 5.50 සිට රුපියල් 3.50 දක්වා අඩු කරනු ලැබූ අතර, පොත් සහ සඟරා සඳහා පනවා තිබූ සියයට 5 තීරු බද්ද නොවැම්බර් මසදී සහමුලින්ම ඉවත් කරන ලදී. යන්ත්‍ර සූත්‍ර සහ රසායන ද්‍රව්‍ය අතරින් තෝරාගත් සමහර භාණ්ඩ සඳහා ආනයන බදු වැඩි කරනු ලැබූ අතර, පොලිතීන් තහඩු සහ කොළ, යකඩ සහ වානේ දඬු හා පොලු සහ හෝමෝන හා ප්‍රතිජීවක ඖෂධ වැනි තවත් සමහර භාණ්ඩ සඳහා තීරුබදු අඩු කරනු ලැබිය.

වසර තුළදී ජනාධිපති තීරුබදු කොමිසම උපදේශක මණ්ඩලයක් ලෙසින් වඩාත් යෝග්‍ය තීරුබදු වෙනස්කම් සඳහා නිර්දේශ කරමින් එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

1981 වසරේදී ආනයනයන් සඳහා ද දීර්ඝ කරන ලද පිරිවැටුම් බද්ද 1983 වසර තුළදී ද අඛණ්ඩව පැවතින. මෙම බද්දේ වැදගත් ලක්ෂණය වූයේ, එය ආනයනයන් නිෂ්පාදකයින්ගේ පිරිවැටුම් බද්ද හා සමාන කිරීමයි. මේ අනුව භාණ්ඩ සඳහා සලසා ඇති ආරක්ෂණයේ ප්‍රමාණය අවශ්‍යයෙන්ම තීරු බදු මගින් නියෝජනය කරනු ඇත.

විවරණයට බඳුන් වන වසර තුළදී, පොහොර ආනයන මත පනවන ලද පිරිවැටුම් බද්ද සියයට 4 සිට සියයට 3 දක්වා අඩු කරන ලද අතර, ඛණිජ තෙල්, සහල්, තිරිඟු සහ තිරිඟු පිටි හැර අනෙකුත් භාණ්ඩ මත පනවනු ලැබ තිබූ සියයට 4 බදු ප්‍රමාණය සියයට 6 දක්වා වැඩි කරනු ලැබිය. සීනි ආනයන සඳහා හැර, සියයට 7½ අනුපාතය සියයට 10 දක්වාත්, සියයට 10 වැඩි අනුපාතයන් තවත් සියයට 5 කිනුත් වැඩි කරන ලදී. ඒ සමගම අපනයන සංවර්ධන සෙස් බද්ද සමහර ආනයන සහ තෝරාගත් ඇතැම් අපනයන සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරිපාලනමය රෙගුලාසිවලට යටත්ව, සම්පූර්ණයෙන්ම අපනයනය සඳහා පමණක් මිශ්‍ර කිරීම, පැකට් කිරීම සහ මලු තේ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය තේ, ආනයනය කිරීම 1983 වසරේද, නිදහස්ව පැවතුණි. 1982 දී ආනයනය කරන ලද රුපියල්

දශ ලක්ෂ 1.3 ක වටිනාකමින් යුත් තේ කිලෝග්‍රෑම් 42,000 හා සසඳන විට, මෙම වසරේ රුපියල් දශ ලක්ෂ 19.9 ක් වටිනාකමින් යුත් තේ කිලෝග්‍රෑම් 557,000 ක් ආනයනය කරන ලදී. සහල් සහ සීනි ආනයනය නිදහස්ව පැවති නමුදු, රටෙහි සහල් සහ සීනි ආනයන වලින් වැඩි කොටසක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලදී. කෙසේ වෙතත්, තිරිඟු ඇට ආනයනය තවදුරටත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඒකාධිකාරයක්ව පැවතුණි.

1983 වසර තුළදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ප්‍රධාන වරාය තුනෙහි හසුරුවන ලද ආනයන හා අපනයන නැව් බඩු ප්‍රමාණය ටොන් දශ ලක්ෂ 7.1 ක් වූ අතර, පසුගිය වසරේ එය ටොන් දශ ලක්ෂ 6.4 ක් විය. කොළඹ වරායේදී වඩාත් නවීන පහසුකම් සළසනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් සංවර්ධන යෝජනා ක්‍රම ගණනාවක් ආරම්භ කරන ලදී. 1983 දී කොළඹ තීරුබදු රහිත සාප්පු සංකීර්ණය මගින් රුපියල් දශ ලක්ෂ 846 ක් වටිනා භාණ්ඩ අලෙවි කරන ලද අතර, 1982 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 885 ක් විය. වසර තුළදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වාභාවික රබර් සහ ජාත්‍යන්තර කෝපි ගිවිසුම්වල අඛණ්ඩ සාමාජිකයකු වූ අතර තේ පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමකට එළඹීම සඳහා සාකච්ඡා වලට ද සහභාගි විය. 1983 දී ආසියානු නිෂ්කාශණ සංගමය මගින් සිදුකල ගණුදෙනුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,618 ක් වූ අතර, 1982 වසරේදී එය රුපියල් දශ ලක්ෂ 4,176 ක් විය.

**අභ්‍යන්තර වෙළෙඳාම**

1983 වසරේදී අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි සැළකිය යුතු වෙනසක් නොවූ අතර, බලධාරීන්ගේ දැඩි බලපෑම්වලින් තොරව නිදහස් වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා වෙළෙඳපොළ බලවේගයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය සහතික කරන ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කරන ලදී. වෙළෙඳපොළ මැදිහත්වීම් සහ පාලනයන් අවම ප්‍රමාණය දක්වා අඩු කරන ලද අතර, ඒවා නිදහස් වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක වැඩ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය මූලිකාංගයන් සැළසීමට පමණක් භාවිතයට යොදනු ලැබීය. මීට අමතරව අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල හිඟයන් මගහරවනු පිණිස සහ සාධාරණ මිළ ගණන් යටතේ විවෘත වෙළෙඳපොළෙහි භාණ්ඩවල සුලභතාවයන් සහතික කිරීම පිණිස බෙදා හැරීමේ ක්‍රමයෙහි බාධක ඉවත් කිරීම විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබීය. මෙම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය ජූලි මස කලබල සමග ඇතිවූ දුෂ්කර අවස්ථාවන්හිදී විද්‍යාමාන විය.

නිදහස් වෙළෙඳපොළ බලවේගයන්ට අනුව වෙළෙඳ කටයුතු හැසිරීමට ඉඩ හරිනු ලැබුවද මිළ හැසිරීම සමාලෝචනය කිරීමට සහ පිළිගත හැකි වෙළෙඳ සමාචාරයන් දිරිගැන්වීම සඳහා ආයතනික පාලනමය ක්‍රමයක් පවත්වාගනු ලැබීය. මෙලෙස, සාධාරණ මිළ ගණන් සහතික කිරීම පිණිසත් අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩයන්ගේ සාධාරණ බෙදා හැරීම මෙන්ම පිළිගත නොහැකි අන්දමේ වෙළෙඳ සමාචාරයන් මුලිනුපුටා දැමීම පිණිසත් අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික ආරක්ෂක පණත, මිළ පාලන පණත සහ කිරුම් සහ මිණුම් ආඥ පණත ක්‍රියාවේ යොදවනු ලැබීය. විවරණයට බඳුන්වන වසර තුළදී පාරිභෝගික ආරක්ෂණ නියෝග වලට අදාළ පාරිභෝගික ද්‍රව්‍යයන් ගණන 376 දක්වා වැඩි කරනු ලැබූ අතර, පසුගිය වසරේදී මිළ පාලනය යටතේ පැවති භාණ්ඩ හතක් මේ වසරේදී භාණ්ඩ තුන දක්වා අඩු කරනු ලැබීය. තිරිඟු පිටි, පාන් සහ මයිසූර් පරිප්පු මෙයට අඩංගු විය. මීට අමතරව අසාධාරණ වෙළෙඳ සමාචාරයන් මුලිනුපුටා දැමීම සඳහා පාරිභෝගික සමිති, අධ්‍යාපනික මධ්‍යස්ථාන (මහපොළ වෙළෙඳ සල්පිල් වලදී) සහ පාරිභෝගික අධ්‍යාපන වැඩ සටහන් (පාරිභෝගික ආරක්ෂණ අරමුදල සවිමත් කිරීම මගින්) එකමුතුව සංවිධානය කිරීම තුළින් පාරිභෝගික අවබෝධය වර්ධනය කිරීමට දැඩි උත්සාහයක් දරණ ලදී. වසර තුළදී, අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව යටතේ පාරිභෝගික සමිති 147 ක් ලියා පදිංචි කළ අතර සැළකිල්ලට ලක්වන

වසර අවසානය වනවිට එම ගණන සමිති 1,514 ක් විය. 1980 පිහිටුවන ලද පාරිභෝගික ආරක්ෂක අරමුදලට රුපියල් 974,563 ක් වසර තුළදී බැර කරන ලද අතර, එම අරමුදලින් සිදුවූ ගෙවුම් රුපියල් 258,896 ක් විය. මීට අමතරව, කුලී පිට ගැනුම් ගිවිසුම්වල අදාළ පාර්ශ්වයන්ගේ කටයුතු සහ බැඳීම් පාලනය කිරීමට 'පාරිභෝගික ණය පණත' නමින් පණතක් 1983 දී ක්‍රියාත්මක විය.

ජාතික මිළ කොමිසම නිෂ්පාදකයින්ගේ අයිතීන් ආරක්ෂා කරන අතරම පාරිභෝගිකයන්ගේ අයිතීන් ආරක්ෂා කරන බලධාරියා ලෙස අඛණ්ඩව කටයුතු කරන ලදී. 1983 වසර තුළදී පාන්, සීනි, ළදරු ධාන්‍ය ආහාර සහ කිරි ආහාරද ඇතුළත්ව මිළ පුනරීක්ෂණයන් 109 ක් සිදුකරන ලදී.

නුදුරු අතීතයේදී මෙන්ම 1983 වසරේදී ද ආහාර ද්‍රව්‍ය සහ සිල්ලර ද්‍රව්‍යයන් ආනයනය කිරීම සහ බෙදාහැරීමෙහිලා පුද්ගලික අංශයේ සහභාගිත්වය වැඩි විය. මෙය වසර කීපයකට පෙර රජයේ ඒකාධිකාරයක්ව පැවති සීනි සහ සහල් බෙදා හැරීමේදී ප්‍රත්‍යක්ෂ විය.

ලිහිල් කරන ලද වෙළෙඳ ප්‍රතිපත්ති යටතේ වාණිජමය වශයෙන් ඵලදායි වීම සහ පුද්ගලික අංශය සමග කාර්යක්ෂමව තරග කිරීම රාජ්‍ය වාණිජ සංවිධානවලින් බලාපොරොත්තුවෙන ලදී. එහෙයින් රාජ්‍ය වාණිජ සංවිධාන තම කටයුතු විවිධාංගීකරණය කිරීමට සහ ප්‍රසාරණය කිරීමට උත්සාහ දරනු ලැබිය. කෙසේ වෙතත්, පුද්ගලික අංශයෙන් එල්ල වූ දැඩි තරගය ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පසුබස්වන සුළු විය. තාවකාලික ඇස්තමේන්තු අනුව, 1983 වසරේදී රාජ්‍ය වාණිජ සංවිධානවල පිරිවැටුම රුපියල් දශ ලක්ෂ 5,910 ක් වූ අතර, 1982 වසරේ එය රුපියල් දශ ලක්ෂ 4,123 ක් විය. 1983 දී වැඩිවූ අලෙවිය ප්‍රධාන වශයෙන්ම ඉහළ මිළ ගණන් පිළිබිඹු වීමකි. සමහර අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාගත හැකි බව සහතික කිරීමේ වැඩ පිළිවෙලක් වශයෙන් සම්භාර තොග පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සමහර රාජ්‍ය වාණිජ සංවිධානවල වෙළෙඳ කටයුතු කෙරෙහි බලපාන ලදී. මේ මගින් ඇතැම් ආයතන මුහුණ පෑ ද්‍රවශීලතා ප්‍රශ්ණ වැඩිවූ අවස්ථා ද විය. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව මයිසූර් පරිප්පු, බොම්බයි ලූනු, කොත්තමල්ලි, කරවල සහ වියළි මිරිස් වැනි පාරිභෝගික භාණ්ඩයන්හි සම්භාර තොග පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කළේය. ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව ආනයනය කරන ලද සීනි ප්‍රමාණයෙහි තියුණු වැඩිවීමක් සටහන් වූ අතර, 1983 දී වී අලෙවි මණ්ඩලය විසින් විවෘත වෙළෙඳ පොළෙහි අලෙවි කරන ලද සහල් ප්‍රමාණයද සියයට 60 කින් වැඩි විය.

දෙවෙනි ලෝක යුද සමයේ සිටම රජයේ අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමේ රටාවෙහි සමුපකාර සමිති අත්‍යාවශ්‍ය කොටසක් විය. මෑත වසර වලදී ද පුද්ගලික අංශය වෙතින් එල්ල වූ ප්‍රබල තරගය හමුවෙහි තම ප්‍රතිපත්ති සහ සමාචාරයන් සකසා ගැනීමට සමුපකාර සමිති උත්සාහ දරා ඇත. මෑත කාලය තුළ අළුත් වෙළෙඳ කටයුතු වල නිරත වුවද සමුපකාර සමිති විසින් සාපේක්ෂ වශයෙන් පහත් ලාභ අන්තරයක් ඇති සහල්, පිටි සහ සීනි වැනි මූලික පාරිභෝගික භාණ්ඩ මෙන්ම ආහාර මුද්දර ක්‍රමය යටතේ බෙදා හරින ලද භාණ්ඩ වෙළෙඳාම ප්‍රධාන ලෙස කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණ මත පදනම්වූ ඇස්තමේන්තු වලට අනුව සමුපකාර සමිතිවල දළ ලාභය 1982 දී සියයට 6 සිට 1983 දී සියයට 5 දක්වා අඩු වුවද ඔවුන්ගේ පිරිවැටුම 1982 දී රුපියල් දශ ලක්ෂ 8,320 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 9,300 දක්වා වැඩි විය. වැඩිවූ ප්‍රවාහන වියදම් සහ අනෙකුත් පරිපාලන වියදම් පියවීම සඳහා මෙම ලාභ අන්තරය ප්‍රමාණවත් නොවූ හෙයින් මෙම වසර තුළදී සමුපකාර අංශය, ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, සළුසල සහ මහජන බැංකුවෙන් ණය පහසුකම් සපයා තිබියදී ද දැඩි මුදල් ප්‍රශ්ණ වලට මුහුණ පෑවේය. 1983 දී සමුපකාර සමිතිවල සිල්ලර වෙළෙඳසැල් ගණන 7,690 දක්වා අඩු වූ අතර, සේවක සංඛ්‍යාව 45,000 ක් පමණ විය.

1983 ජූලි කලබල සමය තුළදී ජාතික බෙදා හැරීමේ ක්‍රමයෙහි අත්‍යාවශ්‍ය කොටසක් ලෙස සමුපකාර සමිතිවල වැදගත්කම විද්‍යාමාන විය. මූලික පාරිභෝගික ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟයන් ඉවත් කරමින් ද ඒවායේ සමාන බෙදාහැරීම පවත්වා ගනිමින්ද සමුපකාර සමිති මාහැඟි කාර්ය භාරයක් ඉටු කරන ලදී. මෙම කාලය තුළදී තම සේවාවන් කඩිනමින් ව්‍යාප්ත කිරීමෙන් සහ පුළුල් කිරීමෙන් සමුපකාර අංශය කළ සේවාව ලිහිල් ආර්ථිකයක් තුළදී වුව ද සටහන් කිරීම වටනේය.

මේ කරුණ අනුව, සමුපකාර අංශයේ වාණිජමය වශයෙන් ඵලදායි තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් පහසුකම් පුහුණු කිරීම් සහ අනෙකුත් දිරිගැන්වීම් ලබා දීමේ අවශ්‍යතාවය පිළිගත යුතුව ඇත.

## සංචාරක ව්‍යාපාරය

මූලික වශයෙන් සිය පාලනයෙන් බාහිර වූ හේතූන් නිසා, 1983 වසරේ දී සංචාරක ව්‍යාපාරයේ පසුබෑමක් දක්නට ලැබුණි. සංචාරකයන්ගේ පැමිණීම්, සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්, හෝටල් උපයෝගීකරණය හෝ සේවා නියුක්තිය වැනි දර්ශකයන් ගැන සළකා බැලීමේදී 1983 දී, මෙම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි අයහපත් තත්ත්වයක් දක්නට ලැබුණි. ජූලි මාසයේ දී දිවයින තුළ ඇතිවූ කැලඹිලි මෙම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි වූ පහත් මට්ටම කෙරෙහි ඉතා තියුණු ලෙස බලපෑ සාධකය විය. ඊට අමතරව, බොහෝ රටවල් ආර්ථික අවපාත තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් කරා පරිවර්තනය වෙමින් පැවතුන අතර අපගේ ප්‍රධාන සංචාරක වෙළඳපොල වූ බටහිර යුරෝපයේ ආර්ථික තත්ත්වය ද මන්දගාමීව පැවතීම නිසා ශ්‍රී ලංකාවට ලැබිය යුතු නියම ප්‍රතිලාභයන්ගේ ගලා ඒමක් සිදු නොවීය.

1983 දී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විදේශ විනිමය ඉපයීමේ වැදගත්කම අතින් පහතට වැටෙමින් හය වන ස්ථානයට පත් වූ අතර එය පසුගිය වසරේහි දී සිව්වන ස්ථානය ගිම් කරගෙන තිබුණි. 1983 වසර තුළදී මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 3,37,342 ක් වූ අතර මෙය පසුගිය වසරට වඩා සියයට 17 ක අඩුවීමක් පෙන්වීය. පසුගිය වසර කිහිපය මුළුල්ලේ සංචාරකයන් පැමිණීමේ වර්ධන වේගය අඩු වෙමින් පැවතිය ද, 1971 න් පසු එය සෘණ අගයක් ගත් ප්‍රථම අවස්ථාව මෙය විය. පසුගිය වසරේ සම කාලච්ඡේදය හා සසඳන විට 1983 ප්‍රථම භාගයේ දී පැමිණි සංචාරකයින්ගේ ගණන සියයට 10 කින් වැඩි වූ නමුත්, පසු භාගයේදී සියයට 45 කින් අඩු වීම, සංචාරක පැමිණීම් කෙරෙහි ජූලි කලබලවල බලපෑම පැහැදිලිව ප්‍රකට කරන්නක් විය. කෙසේ වෙතත් සඳහන් කළ යුතු අනෙක් වැදගත් කරුණ නම්, සිය රටවැසියන්ට දෙනු ලැබූ තීරු බද්දෙන් නිදහස් දීමනාව, ඉන්දියානු රජය විසින් සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ඉන්දියාවෙන් මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව අඩු වීම නිසා, 1982 ජූනි මාසයට වඩා 1983 ජූනි මාසයේදී සංචාරක පැමිණීම්හි පහත වැටීමක් සිදු වූ බවය. මෙම වසර තුළදී බටහිර යුරෝපය සහ ඔස්ට්‍රලේෂියාව සංචාරක පැමිණීම් පිළිබඳව ඉහළම සෘණ වර්ධන අනුපාතයන් වාර්තා කළ අතර, එම ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 24 ක් සහ සියයට 22 ක් විය. ඉන්දියානු සංචාරකයන්ගේ පැමිණීම් සියයට 6 කින් අඩුවීම ආසියානු කලාපීය සංචාරක පැමිණීම් සියයට 8 කින් පහත බැසීමට ප්‍රධාන හේතුව විය. උතුරු ඇමරිකාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව සියයට 5 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, විමසුමට ලක් වූ වසර තුළදී නැගෙනහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය සියයට 7 කින් වර්ධනය විය. සංක්‍රාමික මගින් හැර පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව පසුගිය වසරේ සංඛ්‍යාව වූ 6,632 හා සසඳන විට සියයට 33 ක වැඩි වීමක් වාර්තා කරමින් 1983 දී 8,836 ක් විය.